# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,145 — 1962 ජුනි 1 වැනි සිකුරාද — 1962.6.1

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## III වැනි කොටස — ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම:—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | - |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්** ... | 311 |
| **ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්** ... | 321 |
| **ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්** ... | — |
| **ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්** ... ... | 321 |
| **ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම** ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**36 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව**

1962 අංක 188 දරණ ආඥාව

යොමු අංකය : ජේ 59/60 එල්. 736/එල්.ඩී/ඇෆ්ජ්/51.

1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, සමාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති,

කොළඹ, 1962 මැයි මස 5 දින.

### උපලේඛනය

| I | II |
|---|---|
| ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා | ඉඩමේ විස්තරය |
| මහනුවර දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක්. | මහනුවර දිස්ත්‍රික්කයේ උඩ දුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ මහ අස්වැද්දුම ගමේ පිහිටි මුළු ප්‍රමාණයෙන් අ. 11, රූ. 3, ප. 10.6ක් පමණ විශාල, දෙමටගස්පිටිය මහ අස්වැද්දුමේ කුඹුර සහ මහ අස්වැද්දුමේ ගම්මැද්ද (අංක 304 දරණ ග. සි. අංක 77 සහ 64 බිම් කැබලි (කොටස්) සහ අංක 69 දරණ කැබැල්ල) නමැති ඉඩම් කැබලි 3ට මායිම් :—<br><br>**1. දෙමටගස්පිටිය (අංක 304 දරණ ග. සි. 77 කැබැල්ල (කොටසක්) අ. 2. රූ. 0, ප. 09 පමණ.**<br><br>උතුරට සහ නැගෙනහිරට : මැදලන්ද කොලොන්ගොල්ල නමැති අංක 304 |

(ඉඩමේ විස්තරය හා සම්බන්ධයි)

දරණ අ. ග. සි. අංක 70 දරණ කැබැල්ල: දකුණට: මහ අස්වැද්දුමේ දෙනිය සහ මහඇස්වැද්දුමේ කුඹුර නමැති අංක 304 දරණ ග. අංක 68 සහ 69 දරණ කැබලි; බස්නාහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස

**2. මහ අස්වැද්දුමේ කුඹුර සහ මහ අස්වැද්දුමේ ගම්මැද්ද (අංක 304 දරණ ග. සි. 64 කැබැල්ල (කොටසක්) අ. 9, රූ. 2, ප. 16 ක් පමණ) :—**

උතුරට: ඇල (304 ග. සි. 67 කැබැල්ල) සහ රජය සතු ඉඩම (304 ග. සි. 68 කැබැල්ල); නැගෙනහිරට: මැදලන්ද කොලොන්ගොල්ල නමැති ඉඩම සහ මහඅස්වැද්දුමේ කුඹුර නමැති ඉඩම (304 ග. සි. 70 සහ 69 කැබැලි); දකුණට: මැදලන්ද කොලොන්ගොල්ල නැමැති ඉඩම. (304 ග. සි. 70 කැබැල්ල); බස්නාහිරට: ඕකුරු ගොල්ල ඇල (304 ග. සි. 16 කැබැල්ල).

**3. මහඅස්වැද්දුමේ කුඹුර (304 ග. සි. 69 කැබැල්ල) ප. 25.6 ක් පමණ :—**

උතුරට: දෙඹවගස්පිටිය නමැති ඉඩම සහ මහ අස්වැද්දුමේ දෙනිය නමැති රජය සතු ඉඩම (304 ග. සි. 77 සහ 68 කැබලි); නැගෙනහිරට: මැදලන්ද කොලොන්ගොල්ල නමැති ඉඩම (304 ග. සි. 70 කැබැල්ල; දකුණට සහ බස්නාහිරට: මහ අස්වැද්දුමේ කුඹුර සහ මහ අස්වැද්දුමේ ගම්මැද්ද නමැති ඉඩම (304 ග. සි. 64 කැබැල්ල).

6-4

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**36 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව**

### 1962 අංක 189 දරන ආඥාව

යොමු අංකය: ජේ. 60/61 එච්.ඒ. 193—ඉට/2/183.

1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 අප්‍රේල් මස 23 වන දින.

### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තර** |
| ගාළු දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියා. | ගාළු දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, පටබැඳිමුල්ල ගම්මුලාදෑණි වසමෙහි, පටබැඳිමුල්ල ගමේ පිහිටි මාදන්ගහවත්ත නොහොත් දෙවොල්ගෙවත්ත නමැති ඉඩමේ පහත සඳහන් මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූ. 1, ප. 5.19 ක් පමණ වූ ඉඩම් කැබැල්ල :— |
| | උතුරට: කොළඹ-ගාළු ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට: අම්බලන්ගොඩ, පටබැඳිමුල්ලේ, ජී. සී. පී. ප්‍රනාන්දු මහතා හිමිකම් කියන වරිපණම් අංක 141 දරණ දෙවොල්ගෙවත්ත නමැති ඉඩම; දකුණට: පාර සඳහා වෙන්කර ඇති බිම් කොටස; බටහිරට: බලපිටිය, පාතමුල්ලේ ඇම්. ජී. ද සිල්වා මහතා හිමිකම් කියන වරිපනම් අංක 145 දරණ දෙවොල්ගෙවත්ත නමැති ඉඩම. |

6-3

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**36 වෙනි වගන්තිය යටතේ ආඥාව**

### 1962කේ අංක 206 දරන ආඥාව

යොමු අංකය: ජේ 59/60 එස් 775
ආර්/කිව් 318 (ඕ—සීර් 107/32/3)

1954 අංක 39 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා.
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 මැයි මස 15 දින.

### උප ලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තර** |
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපත් හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙකු. | කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ දෙහිවල ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාවතුළ කළුබෝවිල නැගෙණහිර කොට්ඨාශයේ පිහිටි සිරි සරණංකර පාරේ වරිපනම් අංක 49/2 සහ 49/1 ක් කොටසක් වූ ප්‍රමාණයෙන් අ. 0, රූඩ් 0, පර්චස් 37ක් පමණ විශාලවූ මාදන්ගහ වත්ත (තණබිම) නමැති ඉඩම් කැබැල්ලට මායිම් :— |
| | උතුරට: සිරි සරණංකර පාර; නැගෙණහිරට: කේ. ඒ. ප්‍රනාන්දු මහතා විසින් අයිතිකම් කියනු ලබන සිරි සරණංකර පාරේ වරිපනම් අංක 47 දරණ ස්ථානය, සහ අයිරින් සේනෙවිරත්න මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 45 දරණ ස්ථානය. |
| | වෝල්ටර් අමරවීර වික්‍රමසිංහ මහතා සහ තවත් අය විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරිසරණංකර පාරේ වරිපනම් අංක 43/3 දරණ ස්ථානයෙන් කොටසක්. |
| | දකුණට: වැලිකඩගේ හෙන්රි විල්බට් බොතේජු මහතා සහ වැලිකඩගේ පබිලිස් බොතේජු මහතා විසින් අයිති |

කම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29 දරණ මාදන් ගහවත්ත තණබිම් නමැති තණකොළ ඉඩමෙන් කොටසක් ;

බස්නාහිරට : ආර්. ඇල්. ස්පිටල් දොස්තර මහතා විසින් අයිතිකම් කියනු ලබන සිරි සරණංකර පාරේ වරිපනම් අංක 49/1 දරණ මාදන් ගහ වත්ත තණබිම නමැති තණකොළ ඉඩමෙන් කොටසක් ;

2. කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ දෙහිවල ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාවතුළ කළුබෝවිල නැගෙනහිර කොට්ඨාශයේ පිහිටි කළුබෝවිල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29 දරණ ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 1, පර්චස් 37 ක් පමණ විශාලවූ මාදන් ගහ වත්ත තණබිම නමැති ඉඩම් කැබැල්ලට මායිම් :—

උතුරට : ආර්. ඇල්. ස්පිටල් දොස්තර මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 49/1 දරණ මාදන් ගහ වත්ත තණබිම් නමැති තණකොළ ඉඩමෙන් කොටසක් ; නැගෙනහිරට : වැලිකඩගේ හෙන්රි විල්බට් බොතේජු මහතා සහ වැලිකඩගේ පබිලිස් බොතේජු මහතා සහ විසින් අයිතිකම් කියනු ලබන මාදන් ගහ වත්ත සහ ගල්පොත්තෙවත්ත නමින් හැඳින්වෙනු ලබන සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29 දරණ ස්ථානයෙන් කොටසක් ද,

සහ වෝල්ටර් අමරවීර වික්‍රමසිංහ මහතා සහ තවත් අය විසින් අයිතිකම් කියනු ලබන සිරි සරණංකර පාරේ වරිපනම් අංක 43/3 දරණ ස්ථානයෙන් කොටසක්.

දකුණට සහ බස්නාහිරට : දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29 දරණ මාදන් ගහවත්ත තණබිම නමැති එම තණකොළ ඉඩමෙන්ම කොටසක්.

3. කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ දෙහිවල ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාව තුළ කලුබෝවිල නැගෙනහිර කොට්ඨාශයේ පිහිටි දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29/6 සිට 29/34 සහ 29/39 සිට 29/44 දක්වා ද දෙහිවල සිරිසරණංකර පාරේ වරිපනම් අංක 29 දරණ ස්ථානයන්ගෙන් කොටස් වූ ප්‍රමාණයෙන් අක්කර 5, රූඩ් 0, පර්චස් 30ක් පමණ විශාලවූ මාදන්ගහවත්ත සහ ගල්පොත්ත වත්ත නමැති ඉඩම් කැබලි දෙකට මායිම් :—

උතුරට : වෝල්ටර් අමරවීර වික්‍රමසිංහ මහතා සහ තවත් අය විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 43/3 දරණ ස්ථානයෙන් කොටසක්, ඇෆ්. ද සිල්වා මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 43 දරණ ස්ථානය, ජේම්ස් ඇල්ප්‍රඩ් ද ජෝන්ග් මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 43/2 දරණ ස්ථානය, කුරුප්පු තන්ත්‍රිගේ රොසලින් නෝනා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ අංක 31/7 දරණ ස්ථානය, ජෝර්ලෙන්තිනා දාබරේ මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 31/6 දරණ ස්ථානය, අල්විස් මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි, සරණංකර පාරේ අංක 31/10 දරණ ස්ථානය, ක්ලැරිස් මාගරට් කුඩුගල මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29/35, 36, 37 සහ 38 සහ 29/2, 3, 4 සහ 5 දරණ ස්ථානයන් කාරියකරවනගේ දොන් අමරදාස සේනෙවිරත්න මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29/1 දරණ ස්ථානය ; නැගෙනහිරට : ඇම්. පී. පෙරේරා මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 44/1 දරණ ස්ථානය ; දකුණට : සුජාතා මාවත හා සිරි මහ විහාර පාරත් අතරේ කරත්ත පාර, කොළඹගේ සයිමන් ද කොස්තා මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 44/8 දරණ ස්ථානය, ගමගේ සරනේරිස් පෙරේරා මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 44/17 දරණ ස්ථානය, මුණසිංහ මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 44/19 දරණ ස්ථානය, වන්නිආරච්චිගේ ජෝන් පොන්සේකා මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 44/20 දරණ ස්ථානය, වන්නිආරච්චිගේ ඇල්වින් පොන්සේකා මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 44/21 දරණ ස්ථානය ; වැලිකඩගේ සේදිරිස් බොතේජු මහතා විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 62/3 දරණ ස්ථානය, සෝමාවතී කෝස්තානෝනා බාරේ වෙලෝනෝනා මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29/23 දරණ ස්ථානය, නුගේගොඩ ගංගොඩවිල විතානගේ ලුවිස් පෙරේරා මහතා සහ තවත් අය විසින් ද, වැලිකඩගේ නෝමන් බොතේජු සහ වැලිකඩගේ සේමනේරිස් බොතේජු මහතුන් විසින් අයිතිකම් කියනු ලබන දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක 29/22 දරණ ගොරකගහ ඕවිට නමැති ස්ථානය ; බස්නාහිරට: දෙහිවල සිරි සරණංකර පාරේ වරිපනම් අංක. 29 දරණ මාදන්ගහවත්ත තණබිම නැමති තණකොළ ඉඩමෙන් කොටසක්, එම ඉඩමේ ඉතිරි කොටස සහ සිරි සරණංකර පාරේ වරිපනම් අංක 43/3 දරණ ඉඩම.

1-2

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1962 අංක 216 දරන ආඥාව

යොමු අංකය : ජේ. 57/58 ට් 507—එල් එච්/බී 208.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන.

ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 මැයි මස 22 දින.

උපලේඛනය

| I | II |
| --- | --- |
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| කළුතර දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියා | අංක ඒ. 2337 දරණ මූලික සැලැස්මේ අංක 32 දරණ බිම් කැබැල්ල. |

6-124

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව**

### 1962 අංක 218 දරන ආඥාව

**යොමු අංකය : ජේ. 61/62 එල් 379—ඉට/1/212.**

ඉඩම් අත් කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ,
1962 මැයි මස 28 දින,

උපලේඛනය

| I | II |
| --- | --- |
| **ආණ්ඩුවේ දිසාපති ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලයලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| | (1) ගාළු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බලපිටිය ගම් මුලාදෑනි වසම තුළ මොහොට්ටිවත්ත නම් ගම පිහිටි, ගලඋඩවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණය අ. 0, රූ. 1, ප. 3.52 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ බිම් කොටස :<br>උතුරට : මාදුගහ ; නැගෙනහිරට : එම ඉඩමේ ම කොටසක් සහ මාදුගහ ; දකුණට : එම ඉඩමේ ම කොටසක් ; බස්නාහිරට : අත්කර ගනු ලබන දිගරොල්ලවත්ත ; |
| | (2) ගාළු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බලපිටිය ගම් මුලාදෑනි වසම තුළ මොහොට්ටිවත්ත නම් ගමේ පිහිටි, දිගරොල්ලවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණය අ. 0, රූ. 0, ප. 28.16 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ බිම් කොටස :<br>උතුරට : මාදුගහ ; නැගෙනහිරට : අත්කරගනු ලබන ගලඋඩවත්ත ; දකුණට : එම ඉඩමේම කොටසක් : බස්නාහිරට : මාදුගහ ; |

6-246

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

පහත විස්තර කරන ඉඩම මහජන කායඝියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොඨාශයේ, උඩුවෙල පල්ලේගම ගම්මුලාදෑනි වසමේ, උඩුවෙල පල්ලෙගම ගමේ පිහිටි පුඹලුහේන නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 150 × 140 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස :—

උතුරට : බෝගහලන්ද රජයේ ජනපදය ; නැගෙනහිරට සහ බටහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස් ; දකුණට : අම්පිටිය-උඩුවෙල ප්‍රසිද්ධ පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය : ජේ. 59/60 ඩබ්ලිව්. 597/ඇල්ඩී/ඊ/48.

1962 මැයි මස 17 දින,
කොළඹදීය.

6-149

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥා පනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

පහත විස්තර කරන ඉඩම මහජන කායඝියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

මහනුවර දිස්ත්‍රික්කයේ උඩ දුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ මහ අස්වැද්දුම ගමේ පිහිටි මුළු ප්‍රමාණයෙන් අ. 11, රූඩ්. 3, ප. 10.6 පමණ විශාල දෙමටගස් පිටිය මහා අස්වැද්දුමේ කුඹුර සහ මහඅස්වැද්දුමේ ගම්මැද්ද "අංක 304 දරණ ග.සි. අංක 77 සහ 64 බිම් කැබලි කොටස් සහ අංක 69 දරණ කැබැල්ල" නමැති ඉඩම් කැබලි 3 ට මායිම් :—

1. **දෙඹටගස් පිටිය "අංක 304 දරණ ග.සි. 77 කැබැල්ල කොටසක්" අ. 2; රූ. 0, ප. 09 පමණ :**

   උතුරට සහ නැගෙනහිරට : මැදලන්ද කොලොන්ගොල්ල නමැති අංක 304 දරණ අ.ග.සි. අංක 70 දරණ කැබැල්ල ; දකුණට : මහඅස්වැද්දුමේ දෙනිය සහ මහ අස්වැද්දුමේ කුඹුර නමැති අංක 304 දරණ ග.සි. අංක 68 සහ 69 දරණ කැබලි ; බස්නාහිරට : මෙමම ඉඩමේ ඉතිරි කොටස.

2. **මහ අස්වැද්දුමේ කුඹුර සහ මහ අස්වැද්දුමේ ගම්මැද්ද— අංක 304 දරණ ග.සි. 64 කැබැල්ල. "කොටසක්" අ. 9, රූ. 2, ප. 16ක් පමණ :**

   උතුරට : ඇල් "304 ග.සි. 67 කැබැල්ල" සහ රජය සතු ඉඩම "304 ග.සි. 68 කැබැල්ල" ; නැගෙනහිරට : මැදලන්ද කොලොන්ගොල්ල නමැති ඉඩම සහ මහ අස්වැද්දුමේ කුඹුර නමැති ඉඩම "304 ග.සි. 70 සහ 69 කැබැලි" ; දකුණට : මැදලන්ද කොලොන්ගොල්ල නමැති ඉඩම. "304 ග.සි. 70 කැබැල්ල" ; බස්නාහිරට : ඕකුරුගොල්ලේ ඇල. "304 ග.සි. 16 කැබැල්ල".

3. **මහ අස්වැද්දුමේ කුඹුර—"304 ග.සි. 69 කැබල්ල" ප. 25.6 ක් පමණ :**

   උතුරට : දෙඹටගස්පිටිය නමැති ඉඩම සහ මහ අස්වැද්දුමේ දෙනිය නමැති රජය සතු ඉඩම "304 ග.සි. 77 සහ 68 කැබලි" ; නැගෙනහිරට : මැදලන්ද කොලොන්ගොල්ල නමැති ඉඩම "304 ග.සි. 70 කැබැල්ල" දකුණට සහ බස්නාහිරට : මහ අස්වැද්දුමේ කුඹුර සහ මහ අස්වැද්දුමේ ගම්මැද්ද නමැති ඉඩම. "304 ග.සි. 64 කැබැල්ල".

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 59/60 එල්. 736/ඇල්ඩී/ඇෆ්ජ්/51.

1962 මැයි මස 5 දින,
කොළඹ දීය.

6-133

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥා පනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර සහ පාතහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තල්වත්ත ගම්මුලාදෑනි වසමේ, මහනුවර නගර සභා සීමාව තුල අංක 12 දරණ බුවැලිකඩ නගර සභා කොට්ඨාශයේ ලේවැල්ල පාරේ වරිපනම් අංක 30/5, 30/28, 30/14, 30/15 සහ 30/16 දරණ බංගලාවත්ත නමැති ඉඩමෙන් අක්කර 11 ක පමණ ප්‍රමාණය ඇති කොටසට මායිම්:—

උතුරට: ලයනල් කුලතුංග සහ තවත් අය අයිතිකම් කියන වරිපනම් අංක 32/5, 32/6, 32/7, 32/8 සහ 32/9 දරණ හපුවෙල කුඹුර, ජේ. ඒ. තල්වත්ත අයිතිකම් කියන වරිපණම් අංක 32/10 දරණ හපුවෙල කුඹුර නොහොත් දුරයා කුඹුර වෙදු මුදන්නායක අයිතිකම් කියන වරිපනම් අංක 32/11 දරන දිඹුල්කුඹුර සහ ඇල්. බි. සමරතුංග අයිතිකම් කියන අංක 66/11 දරණ ගහේ වත්තේ කුඹුර නමැති ඉඩම; නැගෙනහිරට: මහවැලි ගඟ; දකුණට: ඇම්. සුභාවික්‍රම සහ තවත් අය අයිතිකම් කියන වරිපනම් අංක 41/27 සහ 41/28 දරණ ගල්පොත්තේ කුඹුර, එච්. ඇම්. කේ. නාරංපනාව සහ ආර්. ඇම්. පුංචිරාල යන අය අයිතිකම් කියන වරිපනම් අංක 41/29 සහ 41/30 දරණ හැවතේ කුඹුර සහ පාරේ කුඹුර යායේ ඇල; බස්නාහිරට: ඊ. ඩයස් ද සිංහ අයිතිකම් කියන මෙම ඉඩමෙ ඉතිරි කොටස, ඒ. වික්‍රමතිලක අයිතිකම කියන වරිපනම් අංක 30/26 දරණ මෙම ඉඩමේ ඉතිරි කොටස, සහ වී. ඇල්. ඞී. ගුණවර්ධන අයිතිකම් කියන වරිපනම් අංක 30/25 දරණ මෙම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ 60/61 ඇස් 497-ඇල්ඞී. 32.

1962 මැයි මස 11 වෙනි දින,
කොළඹදීය.

6-215

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ආදායම් නිලධාරි කොට්ඨාශයේ බෝවල නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 33.6 ක් පමණ වූ දුගොඩැල්ල වත්ත නමැති ඉඩමට මායිම්:—

උතුරට: රජයට අයත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉඩම; දකුණට: ඇම්. ජී. පියසේන අයිතිවාසිකම් කියන දුගොඩැල්ල නමැති ඉඩම සහ මුල්ඔය; නැගෙනහිරට: ඞී. ඞී. විකිරියාට සහ ඇම්. ජී. පියසේනට අයිති මෙම ඉඩමේ කොටසක්; බටහිරට: මුල්ඔය සහ කිතුල්පේ ඇලේ පස් බැම්ම.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ 60/61 එල් 265.

1962 මාර්තු මස 15 දින,
කොළඹදීය.

6-109

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

මෙහි පහත විස්තර කරණු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ලස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි:

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, බටහිර නුවර ගම් පළාතේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අනුරාධපුර නාගරික මුලාදෑනි තැනගේ වසමේ නාගරික කොට්ඨාශයේ අංක 5 හේ කුරුණෑගල පාරේ වරිපනම් අංක 219 (කොටසක්) වශයෙන් පෙන්නුම් කර ඇති, පහත සඳහන් මායිම් තුළ වූ සිත්තම්බලම් සිනමාහල් ඉඩම නමැති ඉඩම:—

උතුරට: ඇස්. සිවරාමලිංගම් මහතා හිමිකම් කියන කුරුණෑගල පාරේ වරිපනම් අංක 132 දරණ ඉඩම; නැගෙනහිරට: කුරුණෑගල පාර; දකුණට: ගෝපාල් රූසරත්නම් මහතා හිමිකම් කියන කුරුණෑගල පාරේ වරිපනම් අංක 148, 150, 152, 154 සහ 156/2 දරණ ඉඩම්; බටහිරට: ඇස්. සිවරාමලිංගම් මහතා හිමිකම් කියන කුරුණෑගල පාරේ වරිපනම් අංක 132/7 හා 132/6 දරණ ඉඩම්.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ 61/62 ඞී 50.

1962 මාර්තු මස 2 දින,
කොළඹ දී ය.

6-214

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7 වැනි වගන්තිය යටතේ වූ දන්වීමයි

අංකය. කිව්. ඒ. 755 බදු අයිතිය.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම්වල ඉඩම් සංවර්ධන ආඥපණත යටතේවූ අවසරපත්‍ර අංක පී. ඒ. 14/ ඒඅන් ඞී. පි සහ පී.ඒ. 13/ඒ. ඇන්.ඞී.පී. පිට ඇති ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:—

ප්ලෑන අංකය: මු. සැ. අංක ඒ. 4895; ගම: මාදම්පැල්ල ඉහල, දුනගහ පත්තුව. අළුත්කුරු කෝරළේ උතුර ඒ. කොළඹ දිස්ත්‍රික්කය.

**කැ. අංකය 1.**

ඉඩමේ නම: කබරයා ගොඩැල්ල වත්ත; විස්තර: අවු. 11 ක්වූ පොල්ගස් 6 ද, කෙසෙල් පඳුරු 4ක් ද, ඇති වත්තක්; හිමිකම් කියන්නා: රජය-ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ බදුකරු කේ. සියදෝරිස් ඉහල මාදම්පැල්ල, දුනගහ; ප්‍රමාණය: අ. 0, රූ. 0 පර්. 12.7.

**කැ. අංකය 2.**

ඉඩමේ නම: කබරයා ගොඩැල්ල වත්ත; විස්තර: අවුරුදු 11ක්වූ පොල් ගස් 6ද, අවු. 3-5ක්වූ පුහුම්දෙල්ල ගස් 4 ක් ද, කැන්දගසක් ද ඇති වත්තක්; හිමිකම් කියන්නා: රජය-ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ බදුකරු-ඇම්. මනික්කුවා ඉහළ මාදම් පැල්ල, දුනගහ; අ. 0, රූ. 0, ප. 11.9.

එකතුව: අ. 0, රූ. 0, ප. 24.6.

ඉහත සඳහන් ඉඩම්වලට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ බදු අවසර පත්‍රද රැගෙන 1962 ක්වූ ජූලි මස 12 වැනි දින පූ. භා. 10 ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962ක්වූ ජූලි මස 3 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වී. පී. ඒ. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත තැන.

1962 ක්වූ මැයි මස 17 වැනි දින,
කොළඹ කච්චේරිය.

6-53

## 1945රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

කිව් ඒ. 747.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

ප්ලෑනය : මූ. සැ. අංක ඒ. 4886. ගම—ඕතරවාඩිය දුනගහපත්තුව අළුත්කුරු කෝරළේ උතුර. ඒ. කොළඹ දිස්ත්‍රික්කය.

**කැ. අංකය : 1.**

ඉඩමේ නම : සේරුගහකොටුව ; විස්තර : උළුසෙවිලි බැම් ගෙයක්ද, අතු සෙවිලි වැසිකිලියක්ද, බැම් ළිඳක්ද, අවු. 50 කට වැඩි පොල් ගස් 20ක් ද, අවු. 3-8ක් වූ පුවක්ගස් 12ක් ද, අවු. 3-5ක්වූ පොල්ග්ස් 2ක්ද, අවු. 3-8ක්වූ පුවක්ගස් 12ක් ද, අවු. 20ක්වූ අඹගස් 2ක්ද, අවු. 2ක්වූ අඹගස් 2ක්ද; අ. 2ක්වූ දොඩම්ගස් 2ක්ද, අවු. 2-5ක්වූ දෙහිගස් 6ක්ද, අවු. 5-6ක්වූ කෝපිගස් 4ක්ද, අවු. 8ක්වූ වෙරළුගසක්ද, ඇති වත්තක් ; හිමිකම කියන්නා : පී. දොන් ඩොමිනික් අප්පුහාමි, ඕතරවාඩිය කටාන ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 04.7

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ ඉඩමේ අයිතිවාසිකම් හා වටිනාකම ඔප්පුකිරීමට ලියවිලිද රැගෙන 1962ක් ජූලි මස 5 වැනි දින පූ. භා. 11.30 ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 ජූනි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දී මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වී. පී. ඒ. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත තැන.

1962 මැයි මස 16 වැනි දින,
කොළඹ කච්චේරිය.

6-63

---

මගේ අංකය : කියු.ඞී. 102.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමෙ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්මේ අංකය ඒ. 4,810. ගම් : පිලිකුත්තු සහ උඟුරුවල.

**කැබැල්ල 1**

ඉඩමේ නම : ඊරියගහකුඹුර නවත කුඹුර ; විස්තර : බැම්මක් ඇති වගා නැති ඉඩම සහ කුඹුර ; අයිතිකම් කියන අය : දොන් චාල්ස්, පන්නල, පිලිකුත්තුව, බුත්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.97.

**කැබැල්ල 2.**

ඉඩමේ නම : ඊරියගහකුඹුර ; විස්තර : බැම්මක් ඇති කුඹුර ; අයිතිකම් කියන අය : පන්නල අප්පුහාමිලාගේ නෝරිස්, පිලිකුත්තුව, බුත්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 05.09.

**කැබැල්ල 3**

ඉඩමේ නම : ඊරියගහකුඹුර ; විස්තර : බැම්මක් ඇති කුඹුර ; අයිතිකම් කියන අය : දොන් චාල්ස්, පන්නල සහ පන්නල අප්පුහාමිලාගේ ඒබ්‍රහම්, දෙදෙනාම පිළිකුත්තුව, බුත්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.54.

**කැබැල්ල 4.**

ඉඩමේ නම : තලයහවගුර ; විස්තර : බැම්මක් ඇති වගා නැති ඉඩම සහ කුඹුර ; අයිතිකම් කියන අය : එල්ක අප්පුහාමිලාගේ ප්‍රැන්සිස් ද අල්විස්, බන්ඩාර හේන, උඟුරුවල, බුත්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 20.91.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1962ක්වූ ජූලි මස 10 වැනි දින, පූ. භා. 10ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1962ක්වූ ජූලි මස 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් වුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ටී. පද්මනාදන්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 මැයි 17 වැනි දින,
කොළඹ කච්චේරිය.

6-161

---

අංකය : කිව්. ඒ. 637.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුවේ අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

ප්ලෑනය : මූ. සැ. අංක ඒ. 4,855, ගම : පෑලියගොඩ පට්ටිය

**කැබැලි අංකය : 1.**

ඉඩමේ නම : ගලගොඩවත්ත ; විස්තර : අවුරුදු 20කට වැඩි පොල් ගස් 103ක්ද, කොස්ගස් 12ක්ද, අඹගස් 14ක්ද, දොඹගස් 1ද, අවුරුදු 5ක්වූ පොල්ගස් 34ක් ද, අවුරුදු 1ක්වූ පොල් පැල 29ක්ද, අවුරුදු 5-10ක්වූ පුවක් ගස් 63 ද, අවුරුදු 3ක්වූ දෙඩම් ගස් 4ක්ද, මාස 6ක්වූ කෝපි ගසක්ද, කෙසෙල් පඳුරු 2ක්ද, බැම් උළු සෙවිලි ගෙයක්ද, බැම් වැසිකිලි 2ක්ද, බැම් ළිඳක් සහ ටැන්කියක්ද, බිං ලිඳක් සහ අඩිපාරක් අඩංගු වත්තක් ; හිමිකම් කියන අය : (1) ජෝන් ප්‍රනාන්දු සිල්වෙස්ටර් පුල්ලේ මිය, පෑලියගොඩ, පට්ටිය, කැළණිය ; (2) ලුයිස රුද්රිගු කන්දප්පා මිය, "ප්‍රෙඩ්විලා" කැළණිය ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 33.4.

**එකතුව : අ. 1, රූ. 0, ප. 33.4.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ ඉඩමේ අයිතිවාසිකම් හා වටිනාකම් ඔප්පු කිරීම පිණිස ලියවිලිද රැගෙන 1962ක්වූ ජූලි මස 24 වැනි දින පූ. භා. 10ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද; 1962ක්වූ ජූලි මස 16 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වී පී. ඒ. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්තතැන.

1962ක්වූ මැයි මස 24 වැනි දින,
කොළඹ කච්චේරිය.

6-225.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතෙන් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ

### 31 බී වගන්තිය යටතේ දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් රජයට ලබාගන්නා නිලධාරි තැන්පත් පතිරනගේ හේමසිරි ප්‍රේමවර්ධන වන මවිසින් 1954 හි අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපණතෙන් සංශොධනය කරනලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 31 වන වගන්තිය යටතේ දැනුම් දී සිටින වගනම්, මෙහි පහත උප ලේඛනයෙහි විස්තර කරන ලද ඉඩම රජයට ලබාගන්නාලද බවත්

ඊට ගෙවිය යුතු වන්දි මුදලෙන් කොටසක් වන රුපියල් 339/58 ක් එම ඉඩම් කොටසේ නියම අයිතිකරු විසින් ලබාගනු වස් මහනුවර දිස්ත්‍රික් උසාවියේ නඩු අංක ඇල්. ඒ. 6613 වෙනුවෙන් තැන්පත් කළ බවත් මෙයින් දැනුම් දී සිටිමි.

පී. එච්. ප්‍රේමවර්ධන,
මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් රජයට ලබාගන්නා නිලධාරි තැන.

1962 මැයි මස 23 වෙනි දින,
මහනුවර දිසාපති කාර්යාලයේදීය.

## උපලේඛනය

මූලික සිතියම් අංක ඒ. 2,780 ; ගම-මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ, උඩසියපත්තු උතුරේ පිලාමුල්ල.

**කැබලි අංක 1, 2 සහ 3.**

ඉඩමේ නම : වෙලගෙදර කුඹුර සහ වෙලගෙදර වත්ත නොහොත් ගෙදරගාව වත්ත ; අයිතිකම් කියන්නා : මාතලේ, පිලිහුඩුගොල්ලේ පදිංචි ව සිටි එච්. ආර්. ජිනදාස ; ප්‍රමාණය : අ. 2, රූ. 1, ප. 26.3 නෙන් 1/12 න් එක පංගුව.

6-150

---

සඳහන් අංකය : ඇල්බී/2437/ජේ 59/60 ඊ 185.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥා පණතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

අංක ඒ 1,950 දරණ මූලික සැලැස්ම

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : එපිටමුල්ලවත්ත, ජිනේන්ද්‍රාරාම පාරේ වරිපණම් අංක 43 සහ 42න් කොටසක් ; ඉඩමේ විස්තරය : අවු. 45 ක් වූ පොල් ගස් 69ක් ද, අවු. 45ක් වූ කොස් ගස් එකක් ද, අවු. 3ක් වූ කජු ගස් 3 ක් ද, අවු. 3 ක් වූ දොඹ ගසක් හා උළු සෙවිලි කළ බැඳ සාදන ලද ගොඩනැගිල්ලක් ද සහිත ඉඩම ; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින : පී. ජී. උසිනා, පී. වී. හරමානිස්, පී. වී. මෙයන්දිස්, පී. වී. ස්මාරිස්, ඊ. කේ. සයිමන්, ඊ. කේ. හරමානිස්, පී. වී. හින්නිඅප්පු, සියළුදෙනාම කුඹුල්ගම, වැලිගම ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 32.

**කැබලි අංකය : 2.**

ඉඩමේ නම : මැද්දවත්ත, ජිනේන්ද්‍රාරාම පාරේ වරිපණම් අංක 37 සහ 37/1 ; ඉඩමේ විස්තර : අවු. 45ක් වූ පොල් ගස් 83ක් ද, අවු. 10 ක් වූ පොල් ගස් 8 ක් ද, අවු. 45 ක් වූ කොස් ගස් 3 ක් ද, අවු. 45 ක් වූ දෙල් ගස් 5 ක් ද, ස්ථිර ලෙස සාදන ලද වලන් පෝරනුවක් හා බැඳ සාදා පොල් අතු සෙවිලි ගොඩනැගිල්ලක් ද සහිත ඉඩම ; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින : පී. වී. මෙන්ඩිස්, පී. වී. නෝනිස්, අයි. සෙනෝරිස්, ඒ. කේ. එරමානිස්, පී. වී. සව්දේරිස්, පී. වී. කර්ලැයින්, පී. වී. සයිමන්, පී. වී. රොසලින්, සියළුදෙනාම කුඹල්ගම, වැලිගම ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 28.

**එකතුව : අ. 1, රූ. 1, ප. 20.**

ඉහත සඳහන් ඉඩම් මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරලේ, වැලිගම පළාත් ආණ්ඩු සභා සීමාව තුළ අංක 7 වල්ලිවල ජන්ද කොට්ඨාශයේ කුඹල්ගම නමැති ගමේ පිහිටා තිබේ.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 ජූලි මස 14 දින උදේ 9.30 ට වැලිගම තානායමේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද, ඔවුන් හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට බලය ලත් නියෝජිතයන් 1962.7.2 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

මේ සම්බන්ධයෙන් අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනිකුත් සියළුම ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රා. සී. පීටර්ස්,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි, මාතර දිස්ත්‍රික්කය.

මාතර කච්චේරිය,
1962 මැයි මස 22 දය.

6-178

---

අංකය : එල්. බී./2476/ජේ. 60/61 ඇල්. 146.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කායසීයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

අංක ඒ 1,951 දරණ මූලික සැලැස්ම

කැබැලි අංක : 1.

ඉඩමේ නම: දෙහිගහඹිවිට; විස්තර: අවු. 8ක් වූ පොල් ගස් 3 හා අවු. 5 වූ දොඹ ගසක් සහිත ඉඩම ; හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපින : එච්. ජී. ගුණසේකර, පලල්ල, වැලිගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 02.0.

කැබැලි අංක : 2.

ඉඩමේ නම : බකින්ගහඹිවිට නොහොත් කදුරුලෙබ්බේගේ ඹිවිට ; විස්තර : (අත්හැර දමන ලද) කුඹුර ; හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපින: ජී. ජී. රොනෙල් අප්පුහාමි, පලල්ල, වැලිගම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.5.

**එකතුව : අ. 0, රූ. 0, ප. 06.5.**

ඉහත සඳහන් ඉඩම්, මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලේ පලල්ල නැමති ගමේ පිහිටා තිබේ.

